# සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ළමා නිවාසවල නිවාස මාතා 111 ශ්‍රේණියේ තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම

සබරගමුව පළාත් සභාවේ කුරුවිට පිහිටා ඇති භාරගැනීමේ ළමා නිවාසයේ හා රත්නපුර දේවාලයගාව ළමා සුභසාධන මධ්‍යස්ථානයේ පුරප්පාඩුවී ඇති තනතුරුවලට බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් සබරගමුව පළාත් සභාව තුල ස්ථිර පදිංචි කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. මේ සඳහා පවත්නා පුරප්පාඩු ප්‍රමාණය 04 කි.

1. කුරුවිට රජයේ භාරගැනීමේ ළමා නිවාසය සඳහා පුරප්පාඩු 02 යි
2. රත්නපුර දේවාලයගාව ළමා සුභසාධන මධ්‍යස්ථානය සඳහා පුරප්පාඩු 02 යි

03. **අයදුම්කිරීම සඳහා තිබිය යුතු සුදුසුකම් :-**

(අ) අයදුම්කාරියන් ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

(ඇ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු, සේවයේ ස්ථිර කරන ලද අයට උපරිම වයස් සීමාව අදාල නොවේ)

(ඈ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්නයෙන් අවුරුදු 06 ක කාලය තුලින් සබරගමුව පළාත් සභා බල ප්‍රදේශයේ අවම වශයෙන් වසර 03 ක අඛණ්ඩ කාලයක් සබරගමුව පළාතේ ස්ථිර පදිංචිය ඇති අයෙකුවීම

04. **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :-**

(අ) 01 **අභ්‍යන්තර අයදුම්කාරියන් :-**

01 (1) පහත සඳහන් "අ " හා " ආ " සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

(අ) නිවාස මාතා /අරක්කැමි/රෙදි සේදුම්කරු (ගැහැණු) යන තනතුරු එකක හෝ වැඩි ගණනක වසර තුනක් හෝ දින 1095 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති දැනට එවැනි තනතුරක ස්ථිර/ තාවකාලික/ අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමක් මත සේවයේ යෙදී සිටින සේවිකාවක් වීම.

(ආ) සේවා කාලය තුල සුළු අවවාද කිරීම් හැර සේවය පැහැර හැරීම්., සේවා අත්හිටුවීම් සිදු නොවුනු හා ඉහත " අ " හි සඳහන් පරිදි සතුටුදායක සේවා කාලයක් තිබීම අනිවාරය වේ.

01 (2) අ.පො.ස. (සා.පෙ) හෝ ඒ හා සමාන විභාගයකදී සිංහල /දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් 03 කට සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් 06 ක් සමත්වීම සහ අ.පො.ස. (උ.පෙළ) විෂයයන් 03 ක් සමත්වීම.

(ආ) 02 බාහිර අයදුම්කරුවන් :-

02.(1) අ.පො.ස. (සා.පෙළ) හෝ ඒ හා සමාන විභාගයකදී සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් 03 කට සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් 06 ක් සමත්වීම සහ අ.පො.ස. (උ.පෙළ) විෂයයන් 03 ක් සමත්වීම.

(2) පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද ළමා නිවාසයක හෝ නිවාසවල වසර 05 කට නොඅඩු අඛණ්ඩ සේවා පළපුරුද්දක් තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

හෝ

ළමා සංවර්ධනය, ළමා මනෝ විද්‍යාව වැනි විෂයයන් සඳහා අමතර පාඨමාලාවන් හදාරා තිබීම විශේෂ සුදුසුකමක් වේ.

(3) සබරගමුව පළාත තුල ලියාපදිංචි ළමා නිවාසයක නේවාසිකව සිටි අනාථ, අත්හල අයදුම්කාරියන් සඳහා පමණක් අවම වශයෙන් 10 වසර සමත්වීම.

05. වැටුප් ක්‍රමය :-

රු. 13120 - 10 x 145 - 11 x 170 - 10 x 240 - 10 x 320 - 22040/- වේ.
( රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 (1v) හි එම්.එන්. 1-2006 ඒ )

06. අයදුම් කිරීමේ ක්‍රමය හා අදාල තොරතුරු :-

(1) මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත් ආකෘතිය අනුව ඒ 4 (සෙ.මී 21x29) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම භාවිතා කරමින් සකස් කරගත් අයදුම්පත්‍රයක් මගින් මෙහි පහත 06(v) සඳහන් කර ඇති පරිදි තම අත්සන සහතික කරවාගෙන අයදුම්කල යුතුය. පළමු පිටුවේ අංක 01 සිට11 දක්වා ද ඉතිරි ඡේද දෙවන පිටුවේද වශයෙන් අයදුම්පත්‍රය සකස් කරගත යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනය **2010.09.15** වේ. අයදුම්පත්‍රය එවිය යුතු ලිපිනය "ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,සබරගමුව පළාත් සභා සංකීර්ණය, නව නගරය, රත්නපුර " වේ. අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, එය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "නිවාස මාතා 111 ශ්‍රේණිය තනතුර " යනුවෙන් සඳහන් කල යුතුය. රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ තනතුරක් දරන නිලධාරිනියක අයදුම්කාරියක වන්නේ නම් ඇයගේ අයදුම් පත්‍රය තමා සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ එවිය යුතුය. එසේ තම ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රය සමග මුදල් ගෙවූ කුවිතාන්සිය අමුණා එවිය යුතුය.

(11) සෑම අයදුම්කරුවෙකුම මේ සඳහා පවත්වන ලද ලිඛිත විභාගය වෙනුවෙන් විභාග ගාස්තුවක් ගෙවිය යුතුය. විභාග ගාස්තුව රු. 300/- කි. විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට, දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) හෝ සබරගමුව පළාත තුළ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරනු ලබන කුවිතාන්සිය අයදුම්පතේ අදාල ස්ථානයේ ඇලවිය යුතුවේ. මෙම විභාග ගාස්තුව ගෙවිය යුත්තේ සබරගමුව පළාත් සභාවේ ආදායම් ශීර්ෂ 2003-90-01 දරණ ශීර්ෂයට බැරවන ලෙසටය. ගෙවන ලද විභාග ගාස්තු කිසිම හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ.

(111) **විභාගය පවත්වන භාෂා මාධ්‍යය** :- විභාගය සිංහල,දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය වලින් පැවැත්වෙන අතර,අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(1v) **අයදුම්පත් භාර ගැනීම** :- ඉල්ලුම්පත් ලද බව දන්වනු නොලැබේ. එවා ඇති සුදුසුකම් සහිත අයදුම්කාරියන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගය පැවැත්වීමට නියමිත දින 07කට කලින් විභාග ප්‍රවේශ පත්‍ර නොලද අපේක්ෂකයන් පහත සඳහන් විස්තර ඇතිව සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විමසිය යුතුය.

විභාගයේ නම :-

අයදුම්කාරියගේ නම :-

ලියාපදිංචි කල තැපැල් කාර්යාලය හා ලියාපදිංචි අංකය හා දිනය:-

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ද, අසම්පූර්ණ අයදුම්පත්ද, නිසි පරිදි සබරගමුව පළාත් සභාවේ ආදායම් ශීර්ෂයට බැරවෙන සේ විභාග ගාස්තු ගෙවා නැත්තාවූ හෝ එම ගෙවීමට අදාල කුවිතාන්සිය අමුණා නොඑවන අයදුම්පත්ද, අදාල සුදුසුකම් නොමැති අයදුම්පත්ද ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රය එවීමට ප්‍රථම මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර තමා සපුරා තිබේද යන්න ගැන අයදුම්කරු සෑහීමකට පත්විය යුතුය. විභාගයට ඉදිරිපත් වීමට ඉඩදීම සුදුසුකම් පිළිගෙන තිබීමක් ලෙස නොසැලකිය යුතුය. ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව අනුව විභාගය පැවැත්වෙන ස්ථානය තීරණය කරනවා ඇත.

(v) **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම:-** අයදුම්කාරියගේ අත්සන සහතික කිරීම රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු /දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු හෝ වර්ෂයකට රු. 2,30,700කට නොඅඩු වාර්ෂික එකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය /පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු ලවා සහතික කල යුතුය.

07. **තෝරා ගන්නා ක්‍රමය** :-

අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට හා සම්මුඛ පරීක්ෂණයකට යොමුකර, පවත්නා පුරප්පාඩු ප්‍රමාණය රත්නපුර හා කෑගල්ල යන දිස්ත්‍රික්කයන් හි ජන අනුපාතය අනුව අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් 60%ක් ද, බාහිර අයදුම්කරුවන්ගෙන් 40% ක් වශයෙන් පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ. (අභ්‍යන්තර අයදුම්කරුවන් ගෙන් 60% ක ප්‍රමාණයක් නොමැතිවිට එම පුරප්පාඩු ප්‍රමාණය බාහිර අයදුම්කාරියන් ගෙන්ද, බාහිර අයදුම්කාරියන් ගෙන් 40% ක් නොමැති විට එම පුරප්පාඩු ප්‍රමාණය අභ්‍යන්තර අයදුම්කාරියක් ගෙන්ද වශයෙන් පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ.) ඒ අනුව එක් දිස්ත්‍රික්කයක ස්ථිර පදිංචිය ඇති අයගෙන් විභාගයේදී ඉහළම ලකුණු ලබා මූලික සුදුසුකම් සපුරා ඇති අයගේ කුසලතා අනුපිළිවෙලින් එම දිස්ත්‍රික්කයට වෙන්කර ඇති සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් පත්කරනු ලැබේ. එසේම තෝරා ගැනීම සඳහා සුදුසුකම් ලැබීමට ලිඛිත විභාගයේදී නියමිත විෂයයන් දෙකෙන් එක් එක් විෂයයට අවම වශයෙන් 40% බැගින් ලකුණු ලබාගත යුතුයි. විභාගයේදී සමාන ලකුණු ලබා සිටීම මත සීමිත පුරප්පාඩු ප්‍රමාණයක් සඳහා තෝරා ගැනීමේ ගැටළුවක් ඇතිවුවහොත් ඒ පිළිබඳ අවසන් තීරණය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබනවා ඇත. මෙම අයදුම්පත් කැඳවීම මත පුරප්පාඩු සියල්ල හෝ පුරප්පාඩුවක් නොපුරවා සිටීම් පිළිබඳ අවසන් තීරණය ගැනීමද සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

08. **ලිඛිත විභාගය** :- ලිඛිත විභාගය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පවත්වනු ලබන අතර, පහත සඳහන් පරිදි ප්‍රශ්ණ පත්‍ර දෙකකින් යුක්ත වේ.

1. **අභියෝග්‍යතා ප්‍රශ්ණ පත්‍රය**
(අපේක්ෂකයාගේ භාෂාමය හා සංඛ්‍යාමය හැකියාවන් පරීක්ෂා කිරීම)
(ලකුණු 100 යි කාලය පැය 01 යි)

11. **සාමාන්‍ය දැනීම ප්‍රශ්ණ පත්‍රය**
(සෞඛ්‍ය හා පෝෂණය, ළමා සංවර්ධනය,ළමා රැකවරණය පිළිබද දැනුම මැනීම)
(ලකුණු 100 යි කාලය පැය 01 යි)

(සමත්වීමේ ලකුණු සංඛ්‍යාව එක් ප්‍රශ්ණ පත්‍රයකට 40%කි)

විභාගය පැවැත්වෙන අවස්ථාවේදී විභාගයට පෙනී සිටීම සඳහා ලැබී ඇති විභාග ප්‍රවේශ පත්‍රය හා අයදුම්කාරියගේ අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රයක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කල යුතුය. එසේම විභාගය පැවැත්වීමේදී අනුගමනය කරන නියමයන් හා කොන්දේසි ද අයදුම්කාරියන් විසින් පිළිපැදිය යුතුය.

09 **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි** :-මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. පත්වීම් ලබන්නන් වර්ෂ 03 ක පරිවාස කාලයකට යටත් කරනු ලබන අතර, අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ස්ථිර සේවයේ යෙදී සිටියේ නම් එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකටත් යටත් කරනු ලැබේ. ඔවුන් ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග හා විටින් විට රජය හා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන නියෝග වලටද යටත් විය යුතුය.

10 **වෙනත් කරුණු** :- විභාගය පැවැත්වීමෙන් පසුව විභාගයේදී ඉහළම ලකුණු ලබා තිබීම මත සුදුසුකම් පරීක්ෂා කර බැලීම සඳහා කැඳවූ විටෙක අයදුම්පත්‍රයේ සඳහන් සත්‍ය තොරතුරු සනාථ කිරීමට අවශ්‍ය ලියවිලි ද, විශේෂයෙන්ම තමා අයදුම්කල දිස්ත්‍රික්කය, ස්ථිර පදිංචිය සනාථ කිරීම සඳහා නියම කරනු ලබන ලියවිලි ඉදිරිපත් කිරීමට සූදානමින් ද සිටිය යුතුය. අයදුම්පත්‍රයේ අසත්‍ය තොරතුරු සඳහන් කර තිබීම අපේක්ෂකත්වය අවලංගු වීමට හේතුවක් වන අතර, පත්වීමක් ලැබුවාට පසුව අසත්‍ය හෝ වැරදි තොරතුරු ඇතුලත් කර අයදුම්කල අයෙකු බව අනාවරණය වුවහොත් සේවයෙන් පහකිරීමට ද යටත් වේ. මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන තීරණයක් ගැනීමේ අයිතිය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

සුනේත්‍රා ගුණවර්ධන
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත.

2010 ජුලි මස 21 වැනි දින
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
සබරගමුව පළාත් සභා සංකීර්ණය
නව නගරය - රත්නපුර.

**සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ළමා නිවාසවල නිවාස මාතා 111 ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ අයදුම් පත්‍රය**

---

විභාග අංකය [ ]

(කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා)

01. මුලකුරු සමග නම:-
    1. ඉංග්‍රීසියෙන් :-

    11 සිංහලෙන් / දෙමළෙන් :-
02. සම්පූර්ණ නම:-
    1. ඉංග්‍රීසියෙන් :-

    11 සිංහලෙන්:-
03. විභාග ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය:-
    1. ඉංග්‍රීසියෙන්:-

    11. සිංහලෙන්:-
04. ස්ථිර පදිංචිය පිළිබඳ සුදුසුකම් ලබා ඇති දිස්ත්‍රික්කය:- [ ]

05. ස්ත්‍රී/පුරුෂ භාවය :- [ ]

    ( ස්ත්‍රී - F පුරුෂ - M ) [ ]

06. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය:- [ ]
    (සිංහල /දෙමළ/ඉංග්‍රීසි)

07. විභාගයට පෙනී සිටීම සඳහා කැමැත්ත ප්‍රකාශ කරන දිස්ත්‍රික්කය:-
    (රත්නපුර / කෑගල්ල)

08. උපන් දිනය :-
    2010. 09.15 දිනට වයස : අවු: මාස : දින:

09. ජාතික හැඳුනුම්පත් අංකය:-

10. දුරකථන අංකය:-

11. අධ්‍යාපන සුදුසුකම්:-
    1. අයදුම් කරන්නේ අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් පරිදි 04(අ) 01 යටතේ **අභ්‍යන්තර අයදුම්කාරියක** වශයෙන් නම් ,
    (අ) දැනට දරණ තනතුර :-
    (ආ) එම තනතුරට පත් වූ දිනය:-
    (ඇ) දැනට සේවය කරන ස්ථානයේ රාජකාරී ලිපිනය:-
    (ඈ) 2010. 09.15 දිනට එම සේවයේ සේවා කාලය:-
    (ඉ) එම තනතුර ස්ථිර/තාවකාලික/අනියම්/ආදේශක/කොන්ත්‍රාත් ද යන්න සඳහන් කරන්න:-

    11. (අ.පො.ස.(සා.පෙළ)/අ.පො.ස.(උ.පෙළ) විභාග සහතික වලට අදාල විභාගයේ නම,වර්ෂය විභාග අංකය හා ලබා ඇති සාමාර්ථයන් පිළිබඳ තොරතුරු දැක්විය යුතු අතර,අදාල විභාගවල හා දරණ තනතුරට අදාල සහතිකවල පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතුය.)

    111. අයදුම් කරන්නේ අයදුම්පත් කැඳවීම් නිවේදනයේ සඳහන් පරිදි 04(අ) 02යටතේ **බාහිර අයදුම්කාරියක** යටතේ නම් ,
    (අ.පො.ස. (සා.පෙළ) /අ.පො.ස.(උ.පෙළ) විභාග සහතික වලට අදාල විභාගයේ නම, වර්ෂය, විභාග අංකය හා ලබා ඇති සාමාර්ථයන් / ලබා ඇති පළපුරුද්ද,පාඨමාලාව පිළිබඳ තොරතුරු දැක්විය යුතු අතර, අදාල විභාගවල/පළපුරුද්ද/පාඨමාලාව ආදී සහතිකවල පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතුය.)

12. තමාගේ ස්ථිර පදිංචිය ඇති දිස්ත්‍රික්කයට අදාල පහත තොරතුරු දක්වන්න.:-

(1) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නම:-

(11) 2010.09.15 දිනට සබරගමුව පළාත් බල ප්‍රදේශය තුල ස්ථිර පදිංචිය ඇති කාලසීමාව:-

13. රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නිරතව සිට කිසියම් හේතුවක් මත ඉන් ඉවත් වී හෝ ඉවත්කර ඇති අයෙකු නම් දැරූ තනතුර, සේවය කල දෙපාර්තමේන්තුව හා ඉවත්වීමට හේතුව සඳහන් කරන්න.:-

14. කිසියම් සාපරාධී වරදකට අධිකරණයෙන් දඩුවම් ලබා ඇත්ද? එසේ නම් විස්තර දක්වන්න:-

15. විභාග ගාස්තුව වශයෙන් රු. 300/-ක මුදලක් සබරගමුව පළාත් සභාවේ ආදායම් ශීර්ෂයට බැරවනසේ ගෙවීම් පිළිබඳ තොරතුරු:-

එම මුදල් ගෙවූ දිනය:-
ගෙවූ කාර්යාලය:-
ඒ සඳහා ලැබුණ ලදුපත් අංකය:-
(විභාග ගාස්තුව ගෙවා ලබාගත් ලදුපත මෙම අයදුම්පතට අමුණා එවිය යුතුය.)

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. බඳවා ගැනීමේ විභාගය පිළිබඳ කොන්දේසි අනුව ම විසින් සාවද්‍ය තොරතුරු දන්වා ඇතොත් විභාගයට පෙර හෝ පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කල හැකි බවත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

දිනය:- අයදුම්කරුගේ අත්සන

***අයදුම්කරුගේ අත්සන සහතික කිරීම***

මෙම අයදුම්පත ඉදිරිපත් කරන මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත් ඇය දින මා ඉදිරිපිටදී ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන

දිනය:-:
සහතික කරන්නාගේ නම:-
තනතුර හා නිල මුද්‍රාව:-

රජයේ හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයේ නියුතු අයදුම්කාරියක නම් පහත සඳහන් සහතිකයද දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරා ඇති නිලධාරියෙකු විසින් කල යුතුය.

(1) මෙම දෙපාර්තමේන්තුවේ දින සිට තනතුරේ සේවය කරන මහත්මිය/මෙනවිය ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට උපයාගත යුතු සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්,සේවා කාලිය තුල අවවාද කිරීම් හැර සේවය පැහැර හැරීම්,සේවා අත්හිටුවීම් සිදු නොවුනු හා කිසිදු විනය දඩුවමකට භාජනය වී නොමැති සතුටුදායක සේවා කාලයක් ඇති බවත් අයදුම්පතේ සපයා ඇති විස්තර නිවැරදි හා සත්‍ය බවත් සහතික කරමි.

(11) ඉහත තනතුර සඳහා ඇය තෝරා ගතහොත් අයදුම්කාරිය දැනට දරන තනතුරෙන් මුදාහැරිය හැකි/නොහැකි බවත් දන්වමි.

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ හෝ බලය පවරනු ලැබූ නිලධාරියාගේ අත්සන.

නම:-
පදවියේ නාමය:-
දිනය:-
දෙපාර්තමේන්තුව/ආයතනය (කරුණාකර නිල මුද්‍රාව තබන්න):-